බන්ධ:කො:ජ: චක්‍ර ලේඛ අංකය: 25 /2015

මගේ අංකය: කේ.0/51/176 /15,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09,
2015.10.05 වෙනි දින.

සියළුම බන්ධනාගාර අධිකාරීන්,
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත.

## 2016 වසරට ආගමික වතාවත් සිදුකිරීම සඳහා පූජකවරුන් පත්කිරීම

බන්ධනාගාර ආයතන වල රඳවා සිටින සිර/ සැකකරුවන් සඳහා ආගමික වතාවත් සිදුකිරීම සඳහා පත්කර ඇති පූජකවරුන්ගේ නිල කාලසීමාව 2015.12.31 වෙනි දිනෙන් අවසන් වන බැවින් , 2016 වසර සඳහා එම කටයුතු සිදුකිරීමට අළුතින් පූජකවරුන් පත්කිරීමට නියමිතව ඇත.

02. ඒ අනුව , පහත ආකෘති පත්‍රයේ සඳහන් ආකාරයට නිවැරදි තොරතුරු ඇතුලත් පූජකවරුන්ගේ නාම ලේඛණයක් සකස්කර ඔබගේ නිර්දේශය සහිතව **2015.12.10** වෙනි දිනට පෙර මා වෙත එවිය යුතුය.

03. තවද , පසුගිය වර්ෂවල ආගමික කටයුතු සිදුකිරීම සඳහා පත්කරන ලද පූජකවරුන් විසින් සමහර අවස්ථාවලදී නේවාසිකයින් හට අගමික කටයුතු සිදුකරන බව හඟවමින් නේවාසිකයින් වෙනත් ආගම් වලට යොමුකිරීම සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ආයතන විවේචනය කරමින් පුවත්පත් මාධ්‍යවලට අසත්‍ය තොරතුරු ප්‍රචාරය කර ඇති බව මා වෙත වාර්තාවී ඇත. එබැවින් පූජකවරුන් තෝරාගැනීමේදී මෙම කරුණු ගැන ඔබගේ විශේෂ අවධානය යොමුකර අදාල තෝරා ගැනීම් සිදුකර ගැනීමට වගාබලා ගත යුතුය.

04. ඉහත පූජකවරුන් පත් කිරීම සඳහා තෝරා ගැනීමේදී මේ වන විට පත්කර ඇති පූජකවරුන් කොපමණ වාරයක් බන්ධනාගාරයට පැමිණ අදාල ආගමික කටයුතු සිදුකලාද , නැද්ද යන්න සහ ඒ අනුව ඔවුන්ගේ ආගමික මෙහෙවර තවදුරටත් බන්ධනාගාර නේවාසිකයින් හට ප්‍රයෝජනවත්ද යන්න ඇගයීමක් කොට අදාල පූජකවරුන්ගෙන් යම් අයෙකු හෝ කණ්ඩායමක් ආයතනයේ නේවාසිකයින් හට ක්‍රමවත්ව ආගමික කටයුතු සිදුකරගෙන යාමට නුසුදුසු වන බව හැගියයි නම් ඔවුන්ගේ නම් ඉවත් කිරීමට කටයුතු කර එම නම් ඉවත්කිරීමට හේතුන් මා වෙත වාර්තා කල යුතුය. මේ සඳහා අළුතින් පත්කරනු ලබන පූජකවරුන් වේ නම් ඔවුන් පත්කිරීමට හේතුන්ද සංක්ෂිප්තව සටහන් කර ඔබ ආයතනයේ දැනට රඳවා සිටින සිර /සැකකරුවන්ගේ සංඛ්‍යාවට හා ඔවුන් විසින් අදහන ආගමට සරිලන ප්‍රමාණයට පමණක් ගැලපෙන පරිදි අදාල පූජකවරුන් සංඛ්‍යාව තීරණය කර එම නම් සහ අවශ්‍ය තොරතුරු සැපයීම ආයතන අධිකාරී /සහකාර අධිකාරී වරයාගේ වගකීමක් බව සඳහන් කරමි.

04. මීට අමතරව එල්.ටී.ටී.ඊ සිර /සැකකරුවන් රඳවා සිටින ආයතන වලට පත්කරන පූජකවරුන් වෙනුවෙන් ඔවුන් පදිංචි ප්‍රදේශයට අයත් පොලිස් වාර්තා ලබා ගැනීමෙන් පසුව තොරාගනු ලබන සුදුසු පූජකවරුන්ගේ නම් එම වාර්තා සමග මාවෙත යොමුකල යුතු අතර , 2015 වර්ෂයේ පත්කරන ලද පූජකවරුන්ගෙන් ඒ ඒ ආගමට අයත් ප්‍රධාන පූජකවරයා සමග සාකච්ඡා කර ගැනීමෙන් පසුව එම චක්‍රලේඛණයේ කරුණු සම්බන්ධයෙන්ද අවධානය යොමුකර තෝරාගනු ලබන පූජකවරුන්ගේ නම් පමණක් නියමිත දිනට පෙර ඔබගේ නිර්දේශය සහිතව එවීමට කටයුතු කල යුතු බව වැඩිදුරටත් දන්වමි.

### 2016 වර්ෂය සඳහා පූජකවරුන් පත් කිරීම

............................................ බන්ධනාගාරය

| බෞද්ධ | නේවාසික සංඛ්‍යාව | කතෝලික | නේවාසික සංඛ්‍යාව | ඉස්ලාම් | නේවාසික සංඛ්‍යාව | මෙතෝදිස්ත | නේවාසික සංඛ්‍යාව | හින්දු | නේවාසික සංඛ්‍යාව | වෙනත් ආගම් | නේවාසික සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

එම්.බී.ආර්.පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එම්.බී.ආර්. පුෂ්පකුමාර
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09,